සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**පදනම් විභාගය - 2011 ජූලි**

**(53) ව්‍යාපාර අධ්‍යයනය**
Business Studies

2011-07-17
පස්වරු
[2.00-4.00]

**කාලය: පැය 02 යි.**

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  (1) මෙම පත්‍රය **A** සහ **B** යන කොටස් දෙකකින් (02) යුක්ත වේ.
  (2) පහත දැක්වෙන පරිදි ප්‍රශ්න **පහකට (05)** උත්තර ලිවිය යුතුය.
    - **A කොටසේ අංක 01 දරණ ප්‍රශ්නයට, සහ**
    - **B කොටසේ ඕනෑම ප්‍රශ්න හතරකට (04).**
  (3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, **එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  (4) ලකුණු 100.

පිටු ගණන: 06
ප්‍රශ්න ගණන: 07

---

## A - කොටස

බහුවරණ ප්‍රශ්න
මෙම කොටසේ සියළු ම ප්‍රශ්න වලට උත්තර ලියන්න.
ලකුණු 40.

**01.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට **වඩාත්ම නිවැරදි** උත්තරය (1), (2), (3), (4) අතුරෙන් තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාල ඉලක්කම, ප්‍රශ්නයට යොදා ඇති ඉංග්‍රීසි අක්ෂරය සමඟ පිළිතුරු පොතේ ලියන්න.

(A) පහත දැක්වෙන ඒවායෙන් වාණිජ්‍යය සම්බන්ධයෙන් උපකාරක සේවාවක් **නොවන්නේ** කුමක්ද?

(1) මුදල් හා බැංකු. (2) ප්‍රවාහනය.
(3) ගබඩාකරණය. (4) අවදානම් කළමනාකරණය.

(B) පහත දැක්වෙන ඒවායෙන් ආරූඪ හවුල්කරුවෙකු සම්බන්ධයෙන් සත්‍ය වන්නේ කුමක්ද?

(1) වගකීම අසීමිත වීම.
(2) සාමාන්‍යයෙන් වැටුපක් හිමි වීම.
(3) ඔහු හවුල්කරුවෙකු බව මහජනයා නොදැනීම.
(4) කළමනාකරණ කටයුතුවලට සහභාගි වීම.

(C) වගකීම සීමා සහිත යන්නෙන් අදහස් කරනු ලබන්නේ:

(1) සමාගමේ ණය සඳහා සියලුම කොටස්කරුවන් එක සමානව වගකීමට බැඳීමය.
(2) සමාගමට ණයවලින් ඇරිය හැකි ප්‍රමාණයක් පවතින බවය.
(3) ණය සඳහා කොටස්කරුවන් පෞද්ගලිකව නොබැඳෙන බවය.
(4) සාංගමික ව්‍යවස්ථාවලියේ දක්වා තිබෙන ප්‍රමාණයට පමණක් කොටස්කරුවන්ගේ වගකීම සීමාවන බවය.

(D) වෙනත් ආකාරයකට සඳහන් කර නොමැති නම්, චෙක්පතක වලංගු කාලය වන්නේ:

(1) දින 30 කි. (2) මාස 03 කි. (3) මාස 04 කි. (4) මාස 06 කි.

(E) බිල්පතක මුහුණත අත්සන් තැබීමෙන් බිල්පතක් පිළිගනු ලබන්නේ:

(1) ණයකරු ය. (2) ණයලද්දා ය.

(3) ආදායකයා ය. (4) ණයකරු සහ ණයලද්දා යන දෙදෙනාම ය.

(F) පහත දැක්වෙන ඒවායෙන් ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණක් **නොවන්නේ** කුමක්ද?

(1) නිදහස් වෙළෙඳ කලාප ස්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම.

(2) කුඩා හා මධ්‍ය පරිමාණ ග්‍රාමීය ව්‍යවසාය ස්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම.

(3) ස්වයංසේවා නියුක්තිකයන් සඳහා අවශ්‍ය පහසුකම් වන පුහුණු කිරීම, තාක්ෂණික සහයෝගිතාව යන ආදිය සැපයීම.

(4) කාර්මික ගම්මාන ප්‍රවර්ධනය කිරීම.

(G) ආයෝජන මණ්ඩලයේ අනුමැතිය නොලැබෙන ව්‍යාපෘතිවලට අයත් වන්නේ පහත දැක්වෙන කුමන ව්‍යාපාර කාර්යයද?

(1) ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම.

(2) වෙරළ අසළ මුහුදේ මසුන් ඇල්ලීම.

(3) අධ්‍යාපනය.

(4) දේශීය දැව භාවිතයෙන් ලී බඩු නිෂ්පාදනය කිරීම.

(H) "ආසන්නතම හේතුව" යන මූලධර්මයෙන් අදහස් කරන්නේ:

(1) වාරික වශයෙන් රක්ෂිතයා ගෙවා ඇති ප්‍රමාණයට වඩා වැඩි මුදලක් වන්දියක් වශයෙන් රක්ෂණ සමාගම නොගෙවන බවයි.

(2) හිලව්වක් වශයෙන් රක්ෂිතයාට නව භාණ්ඩයක් හිමි වීමයි.

(3) සත්‍ය වශයෙන් සිදු වූ හානිය සඳහා පමණක් රක්ෂිතයාට වන්දි ගෙවීමයි.

(4) රක්ෂිත අවධානමක් මගින් පීඩාවක් සිදු වූ විට රක්ෂිතයාට වන්දි ගෙවීමයි.

(I) හානියක් සිදු කරන ලද පාර්ශවය සහ රක්ෂකයා යන දෙදෙනාගෙන්ම වන්දි ලබා ගැනීමේ හැකියාව වළක්වනු ලබන මූලධර්මය වන්නේ:

(1) දායකත්වය. (2) ආදේශනය. (3) හානිපූරණය. (4) රක්ෂ්‍ය හිමිකම.

(J) වාණිජ පත්‍රයක් යනු:

(1) වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක්ය.

(2) වාණිජ සංවිධානයක් විසින් නිකුත් කරන ලද හර පත්‍රයක්ය.

(3) කෙටිකාලීන අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා සුපිරි සමාගම් විසින් නිකුත් කරනු ලබන සුරැකුම් ලියවිල්ලකි.

(4) මුදල් ණයට ලබා ගැනීම සඳහා රජය විසින් නිකුත් කරන ලියවිල්ලකි.

(K) පහත දැක්වෙන ඒවායෙන් මුදල් වෙළෙඳ පොළට පමණක් සම්බන්ධවන උපකරණ ඇතුලත් කාණ්ඩය වනුයේ:

(1) වාණිජ පත්‍රිකා, ණයකර, භාණ්ඩාගාර බැඳුම්කර

(2) භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා, තැන්පතු සහතික පත්‍ර

(3) පොරොන්දු නෝට්ටු, ඒකක භාර, භාණ්ඩාගාර බිල්පත්‍ර

(4) ණයකර, සාමාන්‍ය කොටස්, භාණ්ඩාගාර බැඳුම්කර.

(L) පහත දැක්වෙන ඒවායෙන් කොළඹ කොටස් හුවමාරුවේ කාර්යයක් **නොවන්නේ** කුමක්ද?

(1) ණය සහ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සමාගම් ලැයිස්තුගත කිරීමය.

(2) විධිමත් සුරැකුම් වෙළෙඳ පොළක් සහතික කිරීම සහ වෘත්තීය ප්‍රමිතීන් නඩත්තු කිරීමය.

(3) ලැයිස්තුගත කරන ලද සියලුම සුරැකුම්පත්වල ද්විතික වෙළෙඳ පොළ සඳහා අවශ්‍ය වෙළෙඳ පහසුකම් සැපයීමය.

(4) සියලුම ද්විතික වෙළෙඳ ගනුදෙනු සඳහා වෙළෙඳාමෙන් පසු තුලනය කිරීම, බේරුම් කිරීම, ලියාපදිංචි කිරීම, තැන්පතු පහසුකම් සැලසීමය.

(M) කොළඹ කොටස් හුවමාරුවෙන් "කොටස් සෘජු මිලදී ගැනීම හා විකිණීම" සම්බන්ධයෙන් පහත සඳහන් ද් අතුරෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ:

(1) තැරැව්කරුවෙකු මාර්ගයෙන් කොටස් මිලදී ගැනීම හා විකිණීමය.

(2) සමාගමක් මඟින් කොටස් මිලදී ගැනීම හා විකිණීමය.

(3) තැරැව්කරුවෙකුගෙන් ලබාගත් රහස්‍ය අංකයක් භාවිත කරමින් අන්තර්ජාලය හරහා කොටස් මිලදී ගැනීම හා විකිණීමය.

(4) සෘජුව අන්තර්ජාලය හරහා කොටස් මිලදී ගැනීම හා විකිණීමය.

(N) දූෂ්‍ය නෞභාර පත්‍රයක් මඟින් ප්‍රකාශ වන්නේ:

(1) නැව්ගත කරන ලද භාණ්ඩ භාර දීමේ කොන්දේසි (delivery specification) හෝ අපේක්ෂිත ගුණත්වයෙන් වෙනස්වන බවය.

(2) නැව්ගත කරන ලද භාණ්ඩ නියමිත වෙලාවට නොපැමිණෙන බවය.

(3) හානි සිදුවීම හේතුවෙන් ආනයනකරු භාණ්ඩ තොගය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන බවය.

(4) ආනයනකරු භාණ්ඩ තොගය සඳහා මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරන බවය.

(O) පහත සඳහන් ඒවායින් අවලංගු කළ හැකි ණයවර ලිපියක ප්‍රධාන ලක්ෂණය කුමක්ද?

(1) පිළිඹිබු කරන පොලී අවධානම හේතුවෙන් අවලංගු කළ හැකි ණයවර ලිපි සාමාන්‍යයෙන් අපනයනකරුවන් පිළි නොගනී.

(2) අවලංගු කළ හැකි ණයවර ලිපි එක්කෝ තහවුරු කරනු ලැබිය හැකිය. නැත්නම් තහවුරු කරනු නොලැබිය හැකිය.

(3) අවලංගු කළ හැකි ණයවර ලිපියක් අපනයනකරුගේ හෝ අර්ථලාභියාගේ කැමැත්තකින් තොරව සංශෝධනය කිරීම, වෙනස් කිරීම් සහ එහි දැක්වෙන කොන්දේසි අවලංගු කළ හැකිය.

(4) අවලංගු කළ හැකි ණයවර ලිපියක් ඕනෑම අවස්ථාවක හුවමාරු කළ හැකිය.

(P) "ආර්ථික ඒකාබද්ධ වීම යනු වරණාත්මක වෙළෙඳ පිළිවෙත්වල සිට ආර්ථික සංගම් තෙක් විකාශය වීමකි". පහත දැක්වෙන ඒවායෙන් තීරු බදු සංගමයක ගුණාංගයක් **නොවන්නේ** කුමක්ද?

(1) සාමාජික රටවල් අතර ශුන්‍ය බදු අනුපාත පැවතීම.

(2) තීරු බදු නොවන සංරෝධක අඩු කිරීම.

(3) බාහිර තීරු බදු සඳහා පොදු ප්‍රතිපත්තියක් පැවතීම.

(4) සාමාජික රටවල් අතර ප්‍රාග්ධනය හා ශ්‍රමය නිදහසේ සංචලනය වීම.

(Q) පහත දැක්වෙන ඒවායෙන් සාපේක්ෂ වාසි න්‍යායයේ උපකල්පනයක් **නොවන්නේ** කුමක්ද?

(1) නිෂ්පාදනයේ දී රජයේ මැදිහත් වීමක් නොමැති වීම.

(2) වෙළෙඳ සංරෝධක පැවතීම .

(3) භාණ්ඩ දෙවර්ගයක් හා රටවල් දෙකක් පමණක් සැලකිල්ලට ගැනීම

(4) දෙරටේම සම්පත්වල හිමිකාරත්වය ස්ථාවරව නොවෙනස්ව පැවතීම.

(R) පහත දැක්වෙන ඒවායෙන් ගෝලීයකරණය සම්බන්ධයෙන් සත්‍ය **නොවන්නේ** කුමක්ද?

(1) ගෝලීයකරණය යනු ලෝකය හරහා ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික පද්ධති ඒකාබද්ධ වීමය.

(2) ගෝලීයකරණය යනු දුප්පත් ජාතීන්ගේ හෝ අඩු බලයක් සහිත ජාතීන්ගේ වියදමින් දියුණු ජාතීන් තීරණ ගැනීම මෙහෙයවීමයි.

(3) ගෝලීයකරණය යනු ලෝක වෙළෙඳ පොළවල් සහ ව්‍යාපාර අතර සම්බන්ධතාව හා අන්තර් රැඳියාවන් ඇති කිරීමේ ක්‍රියාවලියයි.

(4) ගෝලීයකරණය මගින් අන්තර්ජාතික ආර්ථික ශුභසාධන වාසි ලෝක ජනගහණයට හිමිකර දීමයි.

(S) පහත දැක්වෙන ඒවායෙන් ලෝක වෙළෙඳ සංවිධානයේ අරමුණක් **නොවන්නේ** කුමක්ද?

(1) අන්තර්ජාතික මූල්‍ය ප්‍රශ්න සමතයකට පත් කිරීම සඳහා උදව් කිරීම.

(2) නිදහස් වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම.

(3) වෙළෙඳ ආරවුල් සමතයකට පත් කිරීම.

(4) බහු පාර්ශවීය වෙළෙඳාම සඳහා සාකච්ඡා පැවත්වීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

(T) පහත දැක්වෙන ඒවායෙන් විදේශ විනිමය අනුපාතය අධි තක්සේරු වීම හොඳින් නිර්වචනය කරන්නේ කුමක් මගින්ද?

(1) දේශීය මුදලේ සත්‍ය විදේශ අගයට වඩා අඩු අගයක් රජය පවත්වාගෙන යාම.

(2) දේශීය මුදලේ සත්‍ය විදේශ අගයට වඩා වැඩි විදේශ අගයක් රජය පවත්වාගෙන යාම.

(3) විදේශ මුදල්වලට ඇති ඉල්ලුම හා සැපයුම අනුව තීරණය වන විදේශ විනිමය අනුපාතය අඛණ්ඩව වර්ධනය වීම.

(4) ප්‍රධාන විදේශ මුදල්වලට සාපේක්ෂව, දේශීය මුදලේ විදේශ අගය මහ බැංකුව විසින් හිතාමතා අඩු කිරීම.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40)

## B - කොටස

**මෙම කොටසෙන් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් උත්තර ලියන්න.**

ලකුණු 60

02. (a) උදාහරණ එක බැගින් සපයමින් අභ්‍යන්තර වෙළෙඳාම හා බාහිර වෙළෙඳාම පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(b) තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම අතර වෙනස දක්වන්න. (ලකුණු 05)

(c) නිෂ්කර්ශක කර්මාන්ත (extractive industries) වර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

03. (a) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ දැක්වෙන ප්‍රධාන මූලධර්ම පහක් (05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(b) වගකීම සීමාසහිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි මොනවාද? (ලකුණු 05)

(c) රන් කොටස් (golden share) නිර්වචනය කර රන් කොටස් තිබීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

04. (a) ගනුදෙනු කළ හැකි උපකරණ නිර්වචනය කර වෙළෙඳ පොළේ පවත්නා ගනුදෙනු කළ හැකි ප්‍රධාන උපකරණ වර්ග නම් කරන්න. (ලකුණු 05)

(b) මධ්‍යම තැන්පතු ක්‍රමය (Central Depositary System) යනු කුමක්ද? මධ්‍යම තැන්පතු ක්‍රමයට සම්බන්ධ වන්නේ කවුරුන්ද? (ලකුණු 05)

(c) වෙළෙඳ පොළ සහභාගිවන්නන් තත්කාලීන දළ බේරුම් කිරීමේ පද්ධතිය (Real Time Gross Settlements System) මගින් අත්කර ගන්නා වාසි ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

05. (a) "මිලන්කා කොටස් මිල දර්ශකය" සහ "සමස්ථ කොටස් මිල දර්ශකය" අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(b) වෙනත් ආයෝජන මාර්ගවල ආයෝජනය කරනවාට වඩා සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් අත්වන ප්‍රධාන වාසි ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(c) රජයේ සුරැකුම්පත් විකිණීම සඳහා පවත්නා ප්‍රති විකිණුම් (Repo) හා ප්‍රති මිලදී ගැනීමේ (Reverse repo) කවුළු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

**06.** (a) ගෙවුම් ශේෂයේ ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමේ ඇතුලත් වන අයිතම පහක් (05) ලැයිස්තුගත කරන්න.
(ලකුණු 05)

(b) ගෙවුම් ශේෂයේ අතිරික්තයක් හෝ හිඟයක් ඔබ හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 05)

(c) වෙළෙඳ අනුපාතය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? වෙළෙඳ අනුපාතය පිරිහීමට බලපාන සාධක තුනක්(03) දක්වන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 15)

**07.** පහත දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(a) නිශ්ක්‍රීය හවුල්කරු (Sleeping Partner).

(b) සංවර්ධන බැඳුම්කර (Development Bonds).

(c) අයිතිවාසිකම් නිකුතුව (Right Issue).

(d) මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ (Financial Derivatives).

(e) ප්‍රපාතනය **(**Dumping).

(එකකට ලකුණු 03 බැගින්, මුළු ලකුණු 15)

- o0o -